ඉංග්‍රීසි මාධ්‍ය තරග

| | |
|---|---|
| නිවේදක | • මෙම තරග අංශයේදී එකී තරගකරුවන් එකිනෙකට වෙනස්වූ අවස්ථා කිහිපයක් නිවේදන කාර්යයෙහි යෙදිය යුතුය.<br>• ප්‍රවෘත්ති අංශය ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රවෘත්ති ප්‍රකාශය පිළිගත් ආකෘතියක සම්ප්‍රදාය ලෙස පිළි ගැනේ.<br>• ගුවන්විදුලි හෝ රූපවාහිනී වෙළඳ ප්‍රචාරක දැන්වීමක් ඉදිරිපත් කිරීම.<br>• බාහිර එළිමහන් හෝ ගෘහස්ත සංදර්ශණ අවස්ථාවක් කථනයේ යෙදීම.<br>• සජීවී විස්තර කථනයක යෙදීම/කැමති තේමාවක් ඔස්සේ සිදු කරන ඉදිරිපත් කිරීමක්.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| කථික | • තාරුණ්‍ය හා බැඳුනු වර්තමාන භාවිතාවන් මාතෘකා ලෙස තෝරා ගැනීම සංවිධායක හා විනිශ්චය මණ්ඩලයේ අභිමතය පරිදි සිදු කල යුතුය.<br>• මාතෘකා කිහිපයක් සකස් කර ඉන් එක මාතෘකාවක් තෝරා ගැනීමට තරගකරුවන්ට අවස්ථාව සලසා දිය යුතුය.<br>• කථික අවස්ථාවට විනාඩි 05 කට පෙර මාතෘකාව ලබා දීමට කටයුතු කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| යොවුන් ගායනා | • දිස්ත්‍රික් හා පළාත් තරගයේදී ඕනෑම ජනප්‍රිය ගීතයක් ගායනා කිරීමට අවස්ථාව ලබා දීම.<br>• ජාතික තරගයේ දී නව පදමාලාවක් සංගීතවත් කොට නව නිර්මාණ ගීතයක් ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරන ගීතයේ ශෛලියට වෙනස් ගීතයක්ද ඉදිරිපත් කල යුතුය.<br>• විනිශ්චය මණ්ඩලය ලබා දෙන ගීතයක කොටසක්ද ගායනා කල යුතුය.<br>• මේ සඳහා වාදක කණ්ඩායම උචිත පරිදි තමා විසින් සපයා ගත යුතුය.<br>• පටිගත කල සංගීතයද (music track) යොදා ගත හැකිය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |